# සිංහල සාහිත්‍ය රසාස්වාදය

## ➢ කවියක් රස විඳින්නේ කොහොමද ?

රසිකත්වය යන්නෙන් අදහස් කරන්නේ "ඇගයීමේ හැකියාවයි". කලා රසිකත්වය යනු, කලා නිර්මාණ ඇගයීමට ඇති හැකියාවයි. කාව්‍ය රස වින්දනයේ දී ද එම හැකියාව අපේක්ෂා කෙරේ.

කලා නිර්මාණයක් රස වින්දනය කිරීමට නීති රීති පැනවිය නොහැකිය. පද්‍ය රචනයක් මෙසේ රස විඳිය යුතුව ඇතැයි ද පූර්ව නිශ්චයක් නොමැත. එයව හේතුව එක් එක් පුද්ගලයා තුළ ඇති ඇගයීමේ හැකියාව විවිධ වීමය. එපමණක් නොව ස්වාධීනව කෙනෙකුට තීරණ ගැනීමට ඇති නිදහසටත්, තහංචි පැනවිය නොහැකිය. නිදසුනක් ලෙස වරකා මඳුලක් ගෙන කෙනෙකුට නොයෙක් නොයෙක් ආකාරයෙන් රස විඳිය හැකිය. එහි ඇති ඉරි, හිම්ඩි, කොහොල්ලෑ සමග කෑමට ද පුලුවන. හිම්ඩි, ඉරි ආදිය ඉවත් කොට කිසියම් පිළිවෙළකට කෑමට ද හැකිය. ඒ අනුව කාව්‍ය රස වින්දනයේදී ද තමාගේ කැමැත්ත, ශක්තිය, බුද්ධිය ආදී අංගයන් පදනම් කර ගෙන රස විඳීමට පුලුවන. ඒ නිසා එක් එක් අයෙකුගේ වින්දනය තවත් අයෙකුගේ වින්දන ශක්තියට වඩා වෙනස් වනු ඇත. ඒ නිසාම එකම කලා කෘතියක් දෙස නොයෙක් දෙනා නොයෙක් ආකල්පයෙන් බැලීමට ඉඩ කඩ ඇත. එයට තහංචි පැනවීමට අපට හැකියාවක් නැත. එසේ වුව ද අ.පො.ස (උසස් පෙළ) විභාගයට පෙනී සිටින ඔබට විශේෂ මග පෙන්වීමක් හැටියට ද, පොදුවේ පද්‍ය සාහිත්‍යය කෙරෙහි රුචිකත්වයක් ඇත්තවුනට පහසුවක් ඇතිවනු පිණිස ද පද්‍ය රචනාවක් රස විඳීමේදී අවධානයට ලක් විය යුතු කරුණු කිහිපයක් සාකච්ඡා කිරීමට අදහස් කරමි. එහිදී කාව්‍යක් සාර්ථක වීමට අවශ්‍ය මූලික අංග මොනවාද? ඒවා තමන්ට ලැබී ඇති පද්‍ය රචනාවේ තිබේද? නැද්ද යන්න පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

## ➢ වස්තු විෂය

කවියා කවියක් නිර්මාණය කිරිම සඳහා කිසියම් "වස්තු විෂයක්" උපයෝගී කර ගනු ලැබේ. එය "තේමාව" යනුවෙන් ද හඳුන්වයි. කවියා තෝරා ගන්නා වස්තු විෂය සමාජයට හිතකර ද? අහිතකර ද? එහි සදාතනික වටිනාමක් තිබේ ද? යන්න පිළිබඳව අවධානයට යොමු කිරීම විචාරකයා සතුය.

## ➢ අත්දැකීම්

වස්තු විෂයක් තෝරා ගැනිමේ දී කවියෙකුට අත්දැකීම් බලපානු ඇත. කවියාට අත්දැකීම් ලැබෙන මාර්ග විවිධය. පරිසරයෙන් අත්දැකීම් ලැබීමට පුලුවන. අසා දැනගත් තොරතුරු මගින් අත්දැකීම් ලබා ගැනීමට හැකිය. එසේ නොමැති නම් වාර්තාගත අත්දැකීම් විය හැකිය. එසේත් නැත්නම් මනෝමය සංකල්පයන් පෞද්ගලික අත්දැකීම් කරගත හැකිය. කවියා කළ යුත්තේ තමාගේ අත්දැකීම් පාඨකයාගේ අත්දැකීමක් බවට පත්කිරීමය. එසේ කවියාගේ අත්දැකීම් පාඨකයාගේ අත්දැකීමක් බවට පත්වන විට පාඨකයාට උසස් සිතුවිලි, උත්තම හැඟීම්, පහළ වීම අවශ්‍ය වේ.

කවියාගේ අත්දැකීම් පිළිබඳ ව නිදසුනක් ගෙන බලමු " මහගමසේකර කවියා" " දුකට කියන කවි සීපද" කාව්‍ය රචනාවට අත්දැකීම් කරගෙන ඇත්තේ හේන් ගොවිතැන් කරන ගොවියෙකුගේ දුක්බර මානසික තත්ත්වය ඉදිරිපත් කිරීමය.

පිලේ පැදුර හේනට අරගෙන එනවා

එලා පැදුර මැස්සේ එහි සැතපෙනවා

රටා වියපු අත්දෙක මට සිහිවෙනවා

හිතේ දුකට එතකොට කවි කියවෙනවා

පිලේ ඇති පැදුර හේනට ගෙනගොස් මැස්සේ එලාගෙන නින්දට යන ගොවියාට එම පැදුරේ රටා වියපු අත්දෙක සිහිවේ. එසේ නම් ගොවියාගේ පෙම්වතිය දැන් ගොවියාට අහිමිය. එයින් දැඩි කම්පනයට ඔහු පත්වෙයි. එම නිසා එම දුකට කවි සීපද කියවෙයි. මෙය සජීවී අත්දැකීමකි. ගොවියාගේ මානසික ප්‍රතික්‍රියා හඳුනා ගැනීමට හැකිය. එය අපේ අත්දැකීමක් බවට පත්වේ.

## ➢ භාෂාව

කවියෙකුගේ අත්දැකීම අපේ අත්දැකීමක් බවට පරිවර්තනය කර ගැනීමට උපකාරී වන්නේ භාෂාවයි. කවියා යොදා ගන්නා භාෂාව කාව්‍යයට උචිත විය යුතුය. ඒ නිසා කාව්‍ය රස වින්දනයේදී කවියාගේ අත්දැකීම පාඨකයාගේ අත්දැකීමක් බවට පත්කිරීමට කවියා යොදාගත් කාව්‍ය භාෂාව උචිත ද අනුචිත ද යන්න විමසා බැලීම රස වින්දනයේ දී අවශ්‍ය කාරණයක් වේ. කාව්‍යයක් සාර්ථක වීමට හොඳම වචන හොඳම පිළවෙලට ගැලපිය යුතුය. ඕනෑම සමාජයක සාමාජික කටයුතු සිදු කරන්නේ භාෂාව මගිනි. ආචාර විධි, විශ්වාස ආදිය සටහන් වී ඇත්තේ රටේ ජනතාව කතාකරන භාෂාවෙන්ය. ජාතියක අනන්‍යතාවය සුරැකෙන්නේ භාෂාව මගිනි. භාෂාවෙන් පරිබාහිර වූ සමාජයක් නැත. අදහස් ප්‍රකාශ කිරීමට විවිධ මාධ්‍ය ඇති. පින්තූර, අභිනය ක්‍රම, සංඥා ක්‍රම, ඉරියව් ආදිය යි. එහෙත් භාෂාව තරම් අදහස් ප්‍රකාශ කිරීමට ප්‍රබල වෙනත් මාධ්‍යයක් නැත. කවියා සමාජයට දෙන්නේ උත්තම ගණයේ අදහස් ය. ඒ අදහස් ප්‍රකාශ කිරීමට යෝග්‍ය භාෂාවක් යොදා ගැනීම කිවියාගේ කාර්ය විය යුතුය.

ඇතැම්හු අපේ පැරණි කාව්‍ය සම්ප්‍රදායේ ආ භාෂාව කාව්‍යයට යොදා ගනිති. ඇතැම්හු ව්‍යවහාර භාෂාව යොදා ගනිති. තවත් කෙනෙක් මෙම අංග දෙක මිශ්‍රකර කාව්‍ය නිර්මාණයේ යෙදෙති. එසේම සමහරු කවියාගේ කාව්‍ය භාෂාව උපයෝගී කරගනිති. මේ නිසා තමන්ට රසවිඳීමට ලැබී ඇති පද්‍ය රචනාවේ අන්තර්ගත භාෂාව පිළිබඳව විමසීමක යෙදීම රස විමසන්නාගේ කාර්යකි. මහගමසේකර අතින් අවනා වූ "දුකට කියන කවි සීපද" පද්‍ය පන්තියේ භාෂාව සකස් කිරීමට ජන කවියාගේ කාව්‍ය භාෂාව උපයෝගී කරගෙන ඇති බව පෙනේ. ජන කවියාගේ කාව්‍ය භාෂාවෙ ප්‍රධාන ලක්ෂණය "ගැමි ව්‍යවහාර" අන්තර්ගත වීමයි. නිර්ව්‍යාජත්වය යි. සිව්පද විරිතකට අනුව කාව්‍ය අනුභූතිය ගොඩනගා ගැනීමයි. කෘෂිකර්මය හා බැඳුණු දුක්ඛ දොමනස්සයන් අත්දැකීම් කර ගැනීමයි. " දුකට කියන කවි සීපද" රචනාව තුළ එම ලක්ෂණ අන්තර්ගතය.

භාෂාව ගැන සාකච්ඡා කිරීමේ දී කාව්‍යයට යොදාගෙන ඇති වචන පිළිබඳව ද අවධානය යොමුකළ යුතුවේ. කවියා තෝරාගෙන ඇති වචන මූලික තේමාවට ගැලපේ ද? ඒ වචන මගින් සහෘදයා තුළ ප්‍රසාද ගුණයක් ඇතිවේ ද? ඒ වචන මැනවින් සංඝඨන කර තිබේ ද? එමගින් ධ්වනි ගුණයක් මතුවේ ද? ව්‍යංගාර්ථවත් වචන යොදාගෙන තිබේ ද? ආදී වශයෙන් කවියා යොදාගෙ ඇති වචන මාලාව පිළිබඳව ද රසවින්දනයේ දී සලකා බැලීම උචිතය. මහගමසේකරයන්ගේ "දුකට කියන කවි සීපද" පද්‍ය රචනාවේ එන වචන මූලික තේමාවට ගැලපේ. තමා ආදරය කළ "ළමා ළපටි නෑනා" නැතිවීම නිසා "දුක" ඇති වේ. ඒ "දුක" හිරු අවරට යාම, සඳ අවරට යාම වැනි අවස්ථාවන්ට වඩා බලවත්ය.

ඉර පායා ඉර අවරට ගියාදෝ

සඳ පායා සඳ අවරට ගියාදෝ

ඇඹූ කඳුලු මූදට එක් වුනාදෝ

ළමා ළපටි නෑනා කොයි ගියාදෝ

තමාට ඇති වුන දුක කොතරම්ද, යන්න "ඇඹූ කඳුලු මුහුදට එක් වීම" ලෙස කවියා කියයි. ඒ නිසා මෙහි යොදා ඇති වචන අපූරුය. ඒවා මැනවින් ගලපා තිබීම කවියාගේ ප්‍රතිභාසම්පන්න කවීත්වය පෙන්වන්නකි.

- <u>**උපමා**</u>

කාව්‍ය භාෂාවේ තවත් ලක්ෂණයක් වන්නේ " උපමා" ය. එමගින් කවියාගේ භාෂා හැකියාව ඔපවත් වෙයි. තමන් "රසවිඳින" පද්‍ය පන්තියේ උපමාතිබේ ද? ඒ උපමා උචිත ද? අනුචිත ද? යන්න තෝරා බේරා ගැනීමේ ශක්තිය රසවිඳින්නා තුළ තිබිය යුතුය. සමහර කවීහු සාම්ප්‍රදායික උපමා යොදා ගනිති. සමහරු නව උපමා සොයා යති ඒ කවරක් වුව ද ඖචිත්‍ය ගුණයෙන් යුතු විය යුතුය.

## ➢ සංකල්ප රූප

කවි පන්තියක් සාර්ථක වීමට තවත් වැදගත් සාධකයක් වන්නේ සංකල්ප රූප මැවීමේ හැකියාවයි. සංකල්ප රූප යනුවෙන් අදහස් කරන්නේ කවියා වචන නැමති චිත්‍රයක් මගින් සහෘදයාගේ හදවත තුළ මවනා හැඟීම් ය. චිත්තජ රූපයන් ය. කවියාගේ අත්දැකීම සහෘදයාගේ අත්දැකීමක් බවට පත් කරන්නේ සංකල්ප රූප මැවීමේ හැකියාව මතය. යම්කිසි වස්තුවක් දෙස කවියා විමසීමක යෙදේ. එ පිළිබඳ ව අදහස් දහරාවක් ඔහු මනසේ තැන්පත් කර ගනී. එයින් මනස ප්‍රබෝධයට පත්කර ගනී. ඒ ප්‍රබෝධාත්මක වූ ඔහුගේ සිතුවිලි වචන නැමති චිත්‍රයක් මගින් පාඨකයාට රසවිඳීමට සලස්වයි. එමගින් පාඨකයා ද සියුම් වින්දනයක් ලබා ගනී. සංකල්ප රූප මැවීම යන්නෙන් අදහස් කරන්නේ එයයි. එවැනි අවස්ථාවක් ගෙන බලමු.

අනේ ගිරවුනේ මා බස අසාපන්

නගා සිටුන තැන කොතනද සොයාපන්

පැලේ තනිව මා ඉඳතෙයි කියාපන්

හිතේ දුකට නිදි නැතිවා කියාපන්

කථකයා නෑනා ගැන සිතමින් පැලේ ගතකරන පාලු ජීවිතය පිළිබඳ ව හොඳ චිත්‍රයක් මවන්නට මහගමසේකර කවියා සමත් වූ බව ඉන් පැහැදිලිය. ඔහුගේ ජීවිතයේ දුක්බර පැත්ත නිරූපණය කිරීමට කවියා දැක් වූ කුසලතාව අගය කළ යුතුය.

## ➢ සමාජ දෘෂ්ඨිකෝණය

කවියා සමාජයට දිය යුත්තේ උත්තම අදහස් ය. සමාජය විනාශ කරන, ජනතාවගේ සංවර්ධනයට අහිතකර වන අදහස් ප්‍රකාශ කිරීම උචිත නොවේ. ඒ නිසා ඇතැම්හු ගැඹුරු සමාජ දෘෂ්ඨිකෝණයන් සිය කාව්‍ය නිර්මාණ තුළින් මතු කරන්නට උත්සාහ ගනිති. එවැනි අවස්ථා ඇතොත් ඒ පිළබඳව ද අදහස් ප්‍රකාශ කිරීමට රසවිඳින පුද්ගලයාට හැකිය.

ගුණදාස අමරසේකරයන්ගේ “ අඳුර අපේ දුක නිවාවි” පද්‍ය පන්තියේ පද්‍ය පාඨ කිහිපයක් පහත දැක්වේ.

“යමන් කලුවේ ගෙදර යන්න කන්ද උඩින් අඳුර එනව”

උඹට වගේ මගේ ඇඟටත් හරිම මහන්සිය දැනෙනව

අඳුර තමයි අපේ ඇඟපත නිවන්න දෙයියෝ දුන්නේ

හනික යමන් ගාල් වෙන්න පිදුරු ගොඩේ ගෙයි මුල්ලේ

කරුමෙ තමයි පලිසන් දෙන්නේ මේ විදිහට

බුදුහාමුදුරුවො කීවේ ඒක තමයි දුක නිවන්ට”

මෙම පද්‍ය පාඨ කීපයෙන් අපට පැහැදිලි වන්නේ ජීවන ගමනේ කටුක බව ප්‍රති නිරූපනය කිරීමට කවියා උත්සාහ කළ ආකාරය යි. තමා ගත කරන්නේ ඉතා දුක්බර ජීවිතයකි. ඒ ජීවිතයට පිහිට වන්නේ ''කලුවා'' නැමැති හරකාය. '' අඳුර'' දුප්පත්කමේ සංකේතයයි. එසේ වූයේ පූර්ව කර්ම විපාක නිසාය. මෙවැනි සමාජ දෘෂ්ඨියක් ඇති කාව්‍ය රචනා බොහෝය. එබැවින් සුපරික්ෂාකාරීව ඒවා අධ්‍යයනයකොට එම නිර්මාණය තුළින් කවියා කියන්නට අදහස් කරන ජීවන දහම කුමක් දැ'යි තෝරා බේරා ගත යුතුය.

- **<u>සංයමය</u>**

කාව්‍ය නිරිමාණයේ දී කවියා දැඩි සංයමයකින් සිය කාර්ය කළ යුතුය. සංයමය යන්නෙන් අදහස් කරන්නේ තැන්පත් බවයි. කවියා තැන්පත් වන්නේ වචන භාවිතයේදී ය. පාඨයාගේ හැඟීම් ප්‍රකෝප වන, විකෘති කාමය ඇති කරවන පරිදි වචන යෙදීම, පද ගැළපීම යොග්‍ය නොවේ. පාඨකයාගේ භාවයන් ප්‍රකෝප කිරීම කවියාගේ කාර්ය නොවේ. ඒ නිසා තමන්ට ලැබී ඇති පද්‍ය රචනාව සංයමයෙන් ලියා තිබේද යන්න පිළිබඳව ද අවධානය යොමු කිරීම වැදගත්ය. ඒ අතරම උත්ප්‍රාසය, අනුප්‍රාසය වැනි කාව්‍ය විචාර විධි පිළිබඳව ද අවධානය යොමු කිරීම මැනවි.

සමස්තයක් ලෙස පද්‍ය රචනාව දෙස බලා එය සාර්ථක ද අසාර්ථක ද අසාර්ථක නම් එයට හේතු මොනවා ද? ආදී වශයෙන් නිගමනයකට ඒම සුදුසුය.

ඉසුරු බමුණුසිංහ ආරච්චි,

බුලත්කොහුපිටිය.